# (ආ) කාර්මික නිෂ්පාදනය

## හැඳින්වීම

කාර්මික නිෂ්පාදනය පිළිබඳ මෙම සමීක්ෂණයට 1969 ලිත් වර්ෂයේ කාර්මික ක්‍රියාවලිය ඇතුළත් වේ. පළමුවරට,[1] මහ බැංකුව විසින්ම නිකුත් කැරුණු තැපැල් ප්‍රශ්න මාලාවක් මගින් නිෂ්පාදනය, සේවා නියුක්තිය සහ වැටුප් පිළිබඳ දත්තයන් සම්පාදනය කර ගනු ලැබීය. පසුව කාර්මිකයන් පෞද්ගලිකව හමුවීමෙන්ද, දත්තයන් ලබාගෙන ඇත. මහ බැංකු ප්‍රශ්න මාලාවට කල්වේලා ඇතිව, ව්‍යවසායයන් කිහිපයක් විසින් පිළිතුරු සපයා නොතිබුණමුත්, එකී ව්‍යවසායයනට අදාළ සංඛ්‍යා තොරතුරු කර්මාන්ත සහ ධීවර අමාත්‍යාංශයෙන් ලබාගත හැකිව තිබුණ හෙයින්, මෙම සමීක්ෂණයට හැකි තරම් දුරට විස්තර ඇතුළත් කිරීමට හැකිවනු පිණිස, එකී දත්තයන් මෙම අමාත්‍යාංශයේ සංඛ්‍යා තොරතුරු අංශයෙන් ලබා ගන්නා ලදී. සියළුම කර්මාන්ත වර්ගවල විශාල ඒකකයන් සියයට සියයක්ම පාහේ, මහ බැංකු සමීක්ෂණය සඳහා සංඛ්‍යා තොරතුරු සපයා ඇත. වාර්තා ලබා ගැණීම සඳහා තොරතුරු සකස් කිරීම පිණිස කාලය සීමිත වූ නමුත් දැනට පවත්නා නව කර්මාන්ත වලින් සියයට 85 කට වැඩි ප්‍රමාණයක් මෙම සමීක්ෂණයට ඇතුළත් කොට ඇත.

1968 දී කර්මාන්ත නිෂ්පාදනයේ සමස්ත වටිනාකමෙහි පෙර නොවූ විරූ වැඩි වීමක් දක්නට ලැබුනි. ඉකුත් වාර්ෂික වාර්තාවේ සඳහන් කර ඇති පරිදි මෙම වැඩි, වීමට බොහෝ සෙයින්ම හේතු වූයේ 1967 නොවැම්බරයේ අවප්‍රමාණය කිරීමත්, 1968 මැයි මාසයේ විවිහිස ක්‍රමය ඇති කිරීමත් හේතුකොට ගෙන නිෂ්පාදිත භාණ්ඩයන්ගෙන් මිළ වැඩි වීමය. 1968 පැවැති මිළ වැඩි වීමෙහි බලපෑම් 1969 දීද, නොවෙනස්ව එපරිද්දෙන්ම පැවති හෙයින් 1969 කාර්මික සංඛ්‍යා තොරතුරු 1968 එම තොරතුරු සමග සැසැඳීමෙන් 1967 සහ 1968 වර්ෂයන් අතරතුර කාර්මික වර්ධනයේ ප්‍රමාණය වඩා නිවැරදි අයුරින් දක්වාලයි.

### ප්‍රධාන උපනතීන්

කාර්මික අමු ද්‍රව්‍ය ආනයනයන් ලිහිල් කිරීම පිළිබඳව මෑතකදී රජය විසින් අනුගමනය කල ප්‍රතිපත්ති කාර්මික නිෂ්පාදනයෙහිලා වැදගත් බලපෑමක් ඇති කර තිබේ. II (ආ) සංඛ්‍යා සටහනේ දැක්වෙන අයුරු වාර්තා සපයන ව්‍යාපාරික ආයතන වල කාර්මික නිමැවුමේ මුළු වටිනාකම රුපියල් දශලක්ෂ 1626·8 ක්වී ඇත. මෙය ඉකුත් වසරට වඩා රුපියල් දශලක්ෂ 228·2 ක හෙවත් සියයට 16·3 ක වැඩිවීමකි.

ඉහත සඳහන් සංඛ්‍යා සටහනෙහි ලැයිස්තු ගතකර ඇති පුළුල් කර්මාන්ත වර්ග නවයෙහිම, වාර්තාගත නිෂ්පාදන වටිනාකමෙහි වැඩිවීම් දක්වාලයි. මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතුවූ කර්මාන්ත වර්ග නම් සැකසූ ලෝහ නිෂ්පාදිතයන්, යන්ත්‍රෝපකරණ (සියයට 26 ක්) රසායනික, පෙට්‍රෝලියම්, ගල්අඟුරු, රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදිත, (සියයට 20 ක්), රෙදිපිළි, ඇඳුම් පැළඳුම්, හා සම් කර්මාන්ත (සියයට 19 ක්) හා ආහාර, පාන වර්ග හා දුම්කොළ කර්මාන්ත (සියයට 14 ක්) වෙයි. සැකසූ ලෝහ නිෂ්පාදිතයන්, යන්ත්‍රෝපකරණ සහ රසායනික, පෙට්‍රෝලියම්, ගල් අඟුරු සහ ප්ලාස්ටික් නිෂ්පාදිතයන් එක්කොට ගත් කල, 1969 මුළු නිෂ්පාදිත වැඩි වීමෙන් අඩක් පමණ විය. විශේෂයෙන් රටේ කෘෂිකාර්මික සංවර්ධන වැඩ පිළිවෙල පසුබිම් කොට ගෙන බලන කල, යටකී කර්මාන්ත වර්ග මුල්තැනක් ගත් ප්‍රබල කර්මාන්තයක් විය. ට්‍රෙලර් උපකරණ සඳහා කොටස්, කෘමිනාශකයන්, දිලීර නාශක

1. ඉකුත් වර්ෂවල දී මහ බැංකුව සහ කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශය ඒකාබද්ධව සමීක්ෂණයක් පවත්වා කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශයේ කර්මාන්ත සංවර්ධන අධ්‍යක්ෂකගේ නමින් ප්‍රශ්න මාලාවක් නිකුත් නොකල නමුත්, මෙම වර්ෂයේ කර්මාන්ත ව්‍යාපාරිකයන්ගේ විශිෂ්ඨ සහායක් ලැබිණ.

## 1966-69 කාර්මික නිෂ්පාදනය හා

| කාර්මික ගණය | සමාගම් ගණන | | | | සේවක සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1966 | 1967 | 1968 | 1969 | 1966 | 1967 | 1968 | 1969 |
| I. ආහාර, පානවර්ග සහ දුම්කොළ නිෂ්පාදනය .. .. | 711 | 822 | 588* | 654 | 21838 | 26401 | 24878 | 31889 |
| II. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්ත .. .. | 249 | 393 | 496 | 537 | 21102 | 20052 | 35528 | 25469 |
| III. දව සහ දැව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) .. .. | 1 | 14 | 20 | 15 | 744 | 2453 | 2575 | 3393 |
| IV. කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදනය .. .. | 54 | 78 | 90 | 95 | 2369 | 2660 | 4146 | 4876 |
| V. රසායන ද්‍රව්‍ය, පෙට්‍රෝලියම්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදනයන් .. | 204 | 246 | 284 | 276 | 7509 | 8117 | 11213 | 12414 |
| VI. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදනයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) .. | 13 | 61 | 53 | 75 | 2216 | 6118 | 6084 | 7811 |
| VII. මූලික ලෝහ නිෂ්පාදිතයන් .. .. | — | — | 1 | 1 | — | — | 950 | 960 |
| VIII. සකස් කළ ලෝහ භාණ්ඩ යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ නිෂ්පාදනය .. .. | 144 | 183 | 253 | 282 | 5124 | 7648 | 15529 | 16119 |
| IX. නිෂ්පාදිත භාණ්ඩ (අන් තැනක නොයදහන්) .. | 21 | 33 | 19 | 27 | 516 | 506 | 445 | 795 |
| එකතුව | 1394 | 1830 | 1804 | 1962 | 61418 | 73955 | 101348 | 103726 |

* ආනයන 365 ක් සඳහා වැටුප් බිල

II (ඈ) 1 වැනි සංඛ්‍යා සටහන

# සේවා නියුක්ති සංඛ්‍යාමය විස්තර සම්පිණ්ඩනය

| ශ්‍රමික දින එකතුව (දහස් ගණනින්) | | | | වැටුප් බිල (රුපි. දශ ලක්ෂ) | | | | නිෂ්පාදන වටිනාකම (රුපි. දශ ලක්ෂ) | | | | ශ්‍රමික දින වැටුප් (රුපියල්) | | | | සේවකයෙකුට වෙන්වන ශ්‍රමික දින | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1966 | 1967 | 1968 | 1969 | 1966 | 1967 | 1968 | 1969 | 1966 | 1967 | 1968 | 1969 | 1966 | 1967 | 1968 | 1969 | 1966 | 1967 | 1968 | 1969 |
| 5831 | 7251 | 7122 | 8982 | 38·5 | 52·0 | 46·8 | 58·3 | 389·9 | 422·3 | 609·6 | 641·8 | 6·60 | 7·17 | 6·57 | 6·49 | 267 | 275 | 286 | 282 |
| 5504 | 5324 | 9301 | 6433 | 25·5 | 25·8 | 46·0 | 31·8 | 178·9 | 177·1 | 224·3 | 267·1 | 4·63 | 4·85 | 4·95 | 4·94 | 261 | 266 | 262 | 253 |
| 222 | 458 | 752 | 949 | 2·0 | 3·1 | 6·6 | 7·0 | 6·5 | 10·4 | 16·9 | 18·0 | 9·00 | 6·77 | 8·78 | 7·38 | 298 | 187 | 292 | 280 |
| 674 | 673 | 1187 | 1412 | 4·3 | 5·2 | 8·9 | 10·8 | 33·8 | 34·7 | 54·6 | 62·3 | 6·38 | 7·73 | 7·50 | 7·65 | 284 | 253 | 286 | 290 |
| 1964 | 1916 | 3124 | 3459 | 13·8 | 15·9 | 30·8 | 34·1 | 137·2 | 136·7 | 203·3 | 249·8 | 7·03 | 8·30 | 9·86 | 9·86 | 261 | 236 | 279 | 279 |
| 595 | 1581 | 1670 | 2131 | 5·0 | 11·2 | 17·1 | 18·6 | 32·5 | 69·5 | 92·8 | 123·3 | 8·40 | 7·08 | 10·24 | 8·73 | 269 | 258 | 275 | 273 |
| — | — | 260 | 288 | — | — | 3·4 | 4·0 | — | — | 27·3 | 28·8 | — | — | 13·08 | 13·89 | — | — | 274 | 300 |
| 1194 | 1970 | 3932 | 4501 | 7·6 | 14·1 | 28·2 | 33·7 | 69·8 | 102·0 | 167·1 | 226·2 | 6·37 | 7·16 | 7·17 | 7·49 | 233 | 258 | 253 | 279 |
| 139 | 144 | 114 | 212 | 0·7 | 0·7 | 0·6 | 1·2 | 1·7 | 1·5 | 2·7 | 9·5 | 5·04 | 4·93 | 5·26 | 5·66 | 269 | 281 | 256 | 267 |
| 16123 | 19315 | 27462 | 28367 | 97·4 | 128·0 | 188·4 | 199·5 | 850·3 | 954·2 | 1398·6 | 1626·8 | 6·04 | 6·62 | 6·86 | 7·03 | 263 | 261 | 271 | 273 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## 1965/69 කාර්මික නිෂ්පාදනයේ වටිනාකම කර්මාන්ත වල

| කාර්මික ගණය | නිෂ්පාදන වටිනාකම (රුපියල් දශ ලක්ෂ) | | | | |
|---|---|---|---|---|---|
| | 1965 | 1966 | 1967 | 1968 | 1969 |
| 1· ආහාර පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය .. | 415·5 | 389·9 | 422·3 | 609·6 | 641·8 |
| (අ) සැකසූ ආහාර .. .. .. | 109·2 | 134·5 | 130·6 | 250·0 | 230·5 |
| (ආ) එළවළු තෙල් වර්ග සහ මේද .. .. | 190·4 | 142·3 | 139·7 | 162·0 | 169·5 |
| (ඇ) කල්තබාගත හැකි සහ ටින්වල අසුරන ලද පළතුරු, එළවළු, මස් මාළු සහ අනෙකුත් මුහුදු ආහාර .. | 5·4 | 5·1 | 6·7 | 8·4 | 8·6 |
| (ඈ) විස්කෝතු, කොකෝවා, චොකලට් සහ සීනි රසකැවිලි | 34·9 | 38·6 | 33·3 | 44·3 | 49·9 |
| (ඉ) පාන වර්ග සහ ස්ප්‍රීතු .. .. .. | 23·6 | 17·1 | 20·0 | 34·4 | 77·4 |
| (ඊ) දුම්කොළ .. .. .. | 52·0 | 52·3 | 92·0 | 110 5 | 105·9 |
| 2· රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්ත .. | 171·5 | 178·9 | 177·1 | 224·3 | 267·1 |
| (අ) ගොතන ලද ඇඳුම් පැළඳුම් සහ මැසූ ඇඳුම් හා අනෙකුත් ආයිත්තම් (පාවන් හැර) .. .. | 55·5 | 56·1 | 48·1 | 55·7 | 56·0 |
| (ආ) නූල් කැටීම, රෙදිපිළි වීවීම සහ නිම කිරීම .. | 91·3 | 95·1 | 97·1 | 136·2 | 172·2 |
| (ඇ) පාවහන් සහ සම් නිෂ්පාදිතයන් .. .. | 24·7 | 27·7 | 31·9 | 32·4 | 38·9 |
| 3· දැව සහ දැව භාණ්ඩ නිෂ්පාදනය (ගෘහ භාණ්ඩ ඇතුළුව) .. | 5·2 | 6·5 | 10 4 | 16·9 | 18·0 |
| (අ) දැව නිෂ්පාදිත .. .. .. | — | — | 3·6 | 8·0 | 9·2 |
| (ආ) තුනී ලෑලි .. .. .. | 5·2 | 6·5 | 6·8 | 8·9 | 8·8 |
| 4· කඩදාසි සහ කඩදාසි භාණ්ඩ .. .. .. | 29·3 | 33·8 | 34·7 | 54·6 | 62·3 |
| 5· රසායනික, පෙට්‍රෝලියම්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය .. .. .. | 125·3 | 137·2 | 136·7 | 203·2 | 249·8 |
| (අ) කාර්මික රසායන ද්‍රව්‍ය .. .. .. | 1·6 | 1·9 | 1·9 | 2·3 | 2·2 |
| (ආ) විවිධ රසායනික නිෂ්පාදිතයන් .. .. | 91·2 | 191·9 | 98·2 | 118·9 | 155·6 |
| (ඇ) පෙට්‍රෝලියම් සහ අඟුරු නිෂ්පාදිතයන් .. | — | — | — | 8·3 | 11·0 |
| (ඈ) රබර් නිෂ්පාදිතයන් .. .. .. | 19·1 | 18·9 | 20·7 | 41·3 | 52·8 |
| (ඉ) ප්ලාස්ටික් නිෂ්පාදිතයන් .. .. .. | 13·4 | 14·5 | 15·9 | 32·5 | 28·2 |
| 6· ලෝහ නොවන ඛනිජ භාණ්ඩ නිෂ්පාදනය (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) .. .. | 40·2 | 32·5 | 69·5 | 92·8 | 123·3 |
| (අ) පිඟන් බඩු .. .. .. | 2·4 | 2·3 | 4·4 | 8·5 | 8·7 |
| (ආ) වීදුරු සහ වීදුරු නිෂ්පාදිතයන් .. .. | — | — | — | 4·8 | 7·7 |
| (ඇ) සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිතයන් සහ ඇස්බැස්ටෝස් නිෂ්පාදිතයන් .. .. | 36·5 | 28·8 | 53·5 | 70·0 | 89·0 |
| (ඈ) ඉල්මනයිට් නිෂ්පාදනය .. .. .. | 1·3 | 1·4 | 1·4 | 2·2 | 3·1 |
| (ඉ) ගඩොල් සහ උළු .. .. .. | — | — | 10·2* | 7·3 | 14·8 |
| 7· මූලික ලෝහ භාණ්ඩ .. .. .. | — | — | — | 27·3 | 28·8 |
| (අ) යකඩ සහ වානේ මූලික කර්මාන්ත .. .. | — | — | — | 27·3 | 28·8 |
| 8· සකස්කරන ලද ලෝහභාණ්ඩ සහ යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය | 58·7 | 69·8 | 102·0 | 167·1 | 226·2 |
| (අ) සකස් කරන ලද ලෝහ භාණ්ඩ (යන්ත්‍රෝපකරණ හැර) | 44·7 | 49·0 | 54·1 | 79·4 | 82·0 |
| (ආ) යන්ත්‍ර සූත්‍ර (විදුලි නොවන යන්ත්‍රසූත්‍ර) සහ ප්‍රවාහන උපකරණ .. .. .. | — | — | 19·8 | 45 9 | 77·9 |
| (ඇ) විදුලි යන්ත්‍ර සූත්‍ර, මෙවලම් උපකරණ හා සැපයුම් .. | 14·0 | 20·8 | 28·1 | 41·8 | 66·3 |
| 9· නිෂ්පාදිත භාණ්ඩ (අන් තැනක සඳහන් නොවූ) .. | 1·3 | 1·7 | 1·5 | 2·7 | 9·5 |
| එකතුව .. .. .. | 847·0 | 850·3 | 954·2 | 1,398·6 | 1,626·8 |

* වීදුරු සහ වීදුරු භාණ්ඩ ඇතුලත් වේ.

II (ආ) 2 වැනි සංඛ්‍යා සටහන

## ස්වරූපය හා ප්‍රධාන නිෂ්පාදනය අනුව වර්ග කොට

| කර්මාන්තයෙහි සියයට ගණන | | | | | මුළු කාර්මික නිෂ්පාදනයේ සියයට ගණන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1965 | 1966 | 1967 | 1968 | 1969 | 1965 | 1966 | 1967 | 1968 | 1969 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 49·1 | 45·9 | 44·3 | 43·6 | 39·5 |
| 26·3 | 34·5 | 30·9 | 41·0 | 35·9 | 12·9 | 15·8 | 13·3 | 17·9 | 14·2 |
| 45·8 | 36·5 | 33·1 | 26·6 | 26·4 | 22·5 | 16·7 | 13·0 | 11·6 | 10·4 |
| 1·3 | 1·3 | 1·6 | 1·4 | 1·3 | 0·6 | 0·6 | 0·7 | 0·6 | 0·5 |
| 8·4 | 9·9 | 7·9 | 7·3 | 7·8 | 4·1 | 4·5 | 3·5 | 3·2 | 3·1 |
| 5·7 | 4·4 | 4·7 | 5·6 | 12·1 | 2·8 | 2·0 | 2·8 | 2·4 | 4·8 |
| 12·5 | 13·4 | 21·8 | 18·1 | 16·5 | 6·1 | 6·2 | 8·9 | 7·9 | 6·5 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 20·2 | 21·0 | 18·6 | 16·0 | 16·4 |
| 32·4 | 31·4 | 27·2 | 24·8 | 21·0 | 6·5 | 6·6 | 5·0 | 4·0 | 3·4 |
| 53·2 | 53·1 | 54·8 | 60·7 | 64·5 | 10·8 | 11·2 | 10·2 | 9·7 | 10·6 |
| 14·4 | 15·5 | 18·0 | 14·5 | 14·5 | 2·9 | 3·2 | 3·4 | 2·3 | 2·4 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 0·6 | 0·8 | 1·1 | 1·2 | 1·1 |
| – | – | 34·6 | 47·3 | 51·1 | – | – | 0·4 | 0·6 | 0·6 |
| 100·0 | 100·0 | 65·4 | 52·7 | 48·9 | 0·6 | 0·8 | 0·7 | 0·6 | 0·5 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 3·5 | 4·0 | 3·6 | 3·9 | 3·8 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 14·8 | 16·1 | 14·3 | 14·5 | 15·3 |
| 1·3 | 1·4 | 1·4 | 1·1 | 0·9 | 0·2 | 0·2 | 0·2 | 0·2 | 0·1 |
| 72·8 | 74·3 | 71·8 | 58·5 | 62·3 | 10·8 | 12·0 | 10·3 | 8·5 | 9·6 |
| – | – | – | 4·1 | 4·4 | – | – | – | 0·6 | 0·7 |
| 15·2 | 13·8 | 15·2 | 20·3 | 21·1 | 2·2 | 2·2 | 2·2 | 3·0 | 3·2 |
| 10·7 | 10·5 | 11·6 | 16·0 | 11·3 | 1·6 | 1·7 | 1·6 | 2·3 | 1·7 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 4·7 | 3·8 | 7·3 | 6·6 | 7·6 |
| 6·0 | 7·1 | 6·3 | 9·1 | 7·1 | 0·3 | 0·3 | 0·5 | 0·6 | 0·5 |
| – | – | – | 5·2 | 6·2 | – | – | – | 0·3 | 0·5 |
| 90·8 | 88·6 | 77·0 | 75·4 | 72·2 | 4·3 | 3·4 | 5·6 | 5·0 | 5·5 |
| 3·2 | 4·3 | 2·0 | 2·4 | 2·5 | 0·1 | 0·1 | 0·1 | 0·2 | 0·2 |
| – | – | 14·7 | 7 9 | 12·0 | – | – | 1·1 | 0·5 | 0·9 |
| – | – | 100·0 | 100·0 | 100·0 | – | – | – | 2·0 | 1·8 |
| – | – | 100·0 | 100·0 | 100·0 | – | – | – | 2·0 | 1·8 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 6·9 | 8·2 | 10·7 | 12·0 | 13·9 |
| 76·1 | 70·2 | 53·0 | 47·5 | 36·3 | 5·3 | 5·8 | 5·7 | 5·7 | 5·0 |
| – | – | 19·4 | 24·2 | 34·4 | – | – | 2·1 | 3·3 | 4·8 |
| 23·9 | 29·8 | 27·5 | 28·3 | 29·3 | 1·6 | 2·4 | 2·9 | 3·0 | 4·1 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 2 | 0·2 | 0·1 | 0·2 | 0·6 |
| | | | | | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

වැනි විවිධ යෙදවුම් කෘෂිකාර්මික අංශයට සපයන මෙකී වර්ග දෙකෙහි නිෂ්පාදනය වැඩිවීම හේතුකොට ගෙන 1968 සඳහා වූ වාර්ෂික වාර්තාවේ ආර්ථික හැඩගැස්ම ගැටළු හා ප්‍රතිපත්ති කොටසෙහි සඳහන් වූ පරිදි කෘෂිකර්මය, කර්මාන්තයෙන් නා නා විධ යෙදවුම් උපයෝගී කර ගන්නා අතර, කෘෂිකර්මයෙහි නවීකරණය උසස් වූ තරමටම, කර්මාන්තයෙහි ජනිත වන යෙදවුම්වල පරිමාව හා වටිනාකම වැඩි වන්නේය යන අදහස සනාථ කරයි. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රෝපකරණ වර්ගයෙහි යන්ත්‍ර සූත්‍ර (විද්‍යුත් යන්ත්‍ර සූත්‍ර හැර) සහ ප්‍රවාහන උපකරණ උපගණයේත්, රසායනික, පෙට්‍රෝලියම්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත වර්ගයේ විවිධ රසායනික නිෂ්පාදිත උපගණයේත් සැලකිය යුතු වැඩිවීම් ඇති වී තිබෙන බවද, ඒ ඒ වර්ගයන් විසින් පිළිවෙලින් සියයට 34 කින් සහ සියයට 62 කින් එකී වැඩිවීම්හිලා දුයක වී ඇති බවද II (ආ) 2 සංඛ්‍යා සටහනින් තවදුරටත් අනාවරණය වේ. නිෂ්පාදන අගයෙහි, කැපී පෙණෙන වැඩිවීම්, දක්වා ලූ අනෙකුත් උපගණ වනුයේ, රුපියල් දශලක්ෂ 34 සිට රුපියල් දශලක්ෂ 77 දක්වා වැඩිවූ පාන වර්ග කර්මාන්ත, රුපියල් දශලක්ෂ 136 සිට රුපියල් දශලක්ෂ 172 දක්වා වැඩිවූ, රෙදිපිළි කැටීම, විවීම හා නිමහම් කිරීම සහ රුපියල් දශලක්ෂ 42 සිට රුපියල් දශලක්ෂ 66 දක්වා වැඩිවූ විද්‍යුත් යන්ත්‍ර සූත්‍ර මෙවලම්, උපකරණ සහ සැපයුමය. සිමෙන්ති නිෂ්පාදිත සහ ඇස්බැස්ටෝස් නිෂ්පාදිත උපගණයේ, රුපියල් දශලක්ෂ 70 සිට රුපියල් දශලක්ෂ 89 දක්වාද, රබර් නිෂ්පාදිත උපගණයේ රුපියල් දශලක්ෂ 41 සිට රුපියල් දශලක්ෂ 53 දක්වාද, නිෂ්පාදනයෙහි මඳ වැඩිවීම් දක්නට විය.

1969 තුළදී සැලකිය යුතු වැඩිවීමක් දක්නට නොලත් උපගණ වනුයේ, එළවළු, තෙල් හා මේද, විස්කෝතු, කොකෝවා, චොකලට් හා රසකැවිලි, පාවහන් හා සම් නිෂ්පාදිත කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත, පෙට්‍රෝලියම් හා ගල්අඟුරු නිෂ්පාදිත, වීදුරු හා වීදුරු නිෂ්පාදිත, ගඩොල්, හා උළු, යන්ත්‍ර සූත්‍ර හැර සකස් කළ ලෝහ නිෂ්පාදිත, දැව නිෂ්පාදිත, යකඩ හා වානේ මූලික කර්මාන්ත සහ ඉල්මනයිට්ය. කල් තබා ගැනීම සඳහා පිළියෙල කළ සහ ටින්වල ඇසිරූ පළතුරු, එළවළු, මස් මාළු සහ වෙනත් මුහුදු ආහාර, ගොතන ලද රෙදිපිළි, මසන ලද ඇඳුම්, පාවහන් හැර වෙනත් ඇඳුම් ආයිත්තම්, තුනී ලෑලි, කාර්මික රසායනික, පිඟන් බඩු සම්බන්ධයෙන් නිෂ්පාදන අගයෙහි කිසියම් වෙනසක් ඇති නොවුන අතර පිළියෙල කළ ආහාර සහ දුම්කොළ නිමැවුමෙහි පහත වැටීමක් ඇතිවිණි. නිෂ්පාදන වටිනාකමෙහි වැඩිවීම අනුව කාර්මික උපගණයන්ගේ වර්ගීකරණයක් II (ආ) 2 (I) සංඛ්‍යා සටහනෙහි දක්වේ.

### II (ආ) 2 (1) සංඛ්‍යා සටහන

### නිෂ්පාදනයේ වටිනාකම වැඩිවීම අනුව කර්මාන්ත වර්ගීකරණයක්

| 0—රුපියල් දශලක්ෂ 5 | රුපි: ද. ල. 5—රුපි: දශලක්ෂ 20 | රුපි: ද. ල. 20—රුපි: දශලක්ෂ 50 |
|---|---|---|
| 1· සකස් කළ ආහාර | 1· එළවළු තෙල් සහ මේද | 1· පාන වර්ග |
| 2· ගොතනලද රෙදිපිළි | 2· විස්කෝතු සහ රසකැවිලි | 2· කටින ලද හා වියන ලද |
| 3· දැව | 3· පාවහන් සහ සම් | 3· විවිධ රසායනික |
| 4· තුනීලෑලි | 4· කඩදාසි නිෂ්පාදන | 4· යන්ත්‍රසූත්‍ර සහ උපකරණ |
| 5· පෙට්‍රෝලියම් | 5· රබර් නිෂ්පාදන | 5· විද්‍යුත් යන්ත්‍රසූත්‍ර |
| 6· පිඟන් බඩු | 6· සිමෙන්ති සහ සිමෙන්ති නිෂ්පාදන | |
| 7· වීදුරු | 7· ගඩොල් හා උළු | |
| 8· ඉල්මනයිට් | 8· නිම කළ නිෂ්පාදන (අන් තැනක නොසඳහන්) | |
| 9· යකඩ හා වානේ | | |
| 10· සකස් කළ ලෝහ | | |

වාර්තා සැපයූ ව්‍යාපාරික ආයතන ගණන 1968 දී 1804 ක්වූ අතර, 1969 දී 1962 ක් විය. 1969 සමීක්ෂණයට ඇතුළත්වූ අතිරේක ඒකක 158 බොහෝ කොටම ඉතා කුඩා ව්‍යවසායයන් විය. මේවායේ නිමැයුම සාපේක්ෂිත වශයෙන් ඉතා අඩු වූ හෙයින් මේවා ඇතුළත් කිරීමෙන් මුළු කාර්මික නිෂ්පාදනය, කෙරෙහි ඇතිවූ බලපෑම ඉතා අල්ප විය. වාර්තා සැපයූ ව්‍යාපාරික ආයතන සංඛ්‍යාවෙහි වෙනස සහ කාර්මික වර්ගවල නිෂ්පාදන වටිනාකම II (ආ) 2 (2) සංඛ්‍යා සටහනෙහි සැකෙවින් දක්වා ඇත.

## II (ආ) 2 (2) සංඛ්‍යා සටහන

### වාර්තා සපයන ආයතන සංඛ්‍යාව සහ නිෂ්පාදන වටිනාකම

| | කාර්මික ගණය | | වාර්තා සපයන ව්‍යාපාරික ආයතන සංඛ්‍යාවේ වෙනස | නිෂ්පාදන වටිනාකමෙහි වෙනස, රුපියල් දශලක්ෂ |
|---|---|---|---|---|
| I. | ආහාරපාන වර්ග, සහ දුම්කොළ නිෂ්පාදනය | .. | + 66 | + 32·2 |
| II. | රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් කර්මාන්තය | .. | + 41 | + 42·8 |
| III. | දැව භාණ්ඩ ඇතුළුව දැව සහ දැවභාණ්ඩ නිෂ්පාදනය | .. | − 5 | + 1·1 |
| IV. | කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත | .. | + 5 | + 7·7 |
| V. | රසායනික, පෙට්‍රෝලියම්, ගල් අඟුරු සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | .. | − 8 | + 46·5 |
| VI. | පෙට්‍රෝලියම් හා ගල් අඟුරු ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | .. | + 22 | + 1·5 |
| VII. | මූලික ලෝහ නිෂ්පාදිත | .. | — | + 1·5 |
| VIII. | සැකසූ ලෝහ නිෂ්පාදිත යන්ත්‍රසූත්‍ර හා උපකරණ නිමැයුම් | .. | + 29 | + 59·1 |
| IX. | අන්තැනක නොසඳහන් නිමැයුම් නිෂ්පාදිත | .. | + 8 | + 6·8 |

ආහාරපාන වර්ග සහ දුම්කොළ වර්ගයෙහි වාර්තා සැපයූ ව්‍යාපාරික ආයතන සංඛ්‍යාව 588 සිට 654 දක්වාත්, නිෂ්පාදනයෙහි වාර්තාගත වටිනාකම රුපියල් දශලක්ෂ 609·6 සිට රුපියල් දශලක්ෂ 641·8 දක්වාත් වැඩිවූ නමුදු, පිළියෙල කළ ආහාර උපගණය රුපියල් දශලක්ෂ 250 සිට රුපියල් දශලක්ෂ 230·5 දක්වා පහත වැටුණි. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, මෙම උපගණයේ සැලකිය යුතු අංගයක් වන, කපාපු පොල් නිෂ්පාදනයෙහි වටිනාකම පහත වැටීමය. අනෙක් අතට, පාන වර්ග උපගණය රුපියල් දශලක්ෂ 34·4 සිට රුපියල් දශලක්ෂ 77·4 දක්වා ඉහළ නැගුණි. මෙයට මූලික හේතුව වූයේ, අරක්කු සහ වෙනත් ස්ප්‍රීතු වර්ගවල නිමැයුම ඉහළ යාමය. රෙදිපිළි ගණයේ වාර්තා සැපයූ ව්‍යාපාරික ආයතන ගණන, 41 කින් වැඩි වූ අතර නිෂ්පාදන වටිනාකම රුපියල් දශලක්ෂ 224·3 සිට රුපියල් දශලක්ෂ 267·1 දක්වා ඉහළ නැගුණි. මෙයට ප්‍රධාන හේතුව වූයේ 1969 දී සිය නිමැයුම දෙගුණ වන තරමට වැඩි කළවිශාල ඒකකයන්ගෙන් එකක, නිෂ්පාදන ප්‍රමාණය වැඩිවීමයි. රසායනික පෙට්‍රෝලියම්, ගල්අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදනයන්හිද රුපියල් දශලක්ෂ 46·5 ක සැලකිය යුතු වැඩිවීමක් දක්නට විය. මෙම වැඩිවීමෙන් සියයට 79 ක් කෘෂිරසායනික ඇතුළත්ව, විවිධ රසායනික නිෂ්පාදිත උපගණයෙහි විය. පෙට්‍රෝලියම් සහ ගල්අඟුරු හැර ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත වර්ගයේ සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිත සහ ඇස්බැස්ටෝස් උපගණය මෙම වර්ගයේ, නිමැයුමෙහි වැඩිවීමෙන් තුනෙන් දෙකකට පමණ හේතු විය. සකස් කළ ලෝහ නිෂ්පාදන, යන්ත්‍ර උපකරණ වර්ගයේ ඇතිවූ රුපියල් දශලක්ෂ 59·1 ක නිෂ්පාදනය වැඩිවීම, යන්ත්‍ර සූත්‍ර (විද්‍යුත් නොවන) සහ ප්‍රවාහන උපකරණ සහ විද්‍යුත් යන්ත්‍ර සූත්‍ර, මෙවලම්, උපකරණ සහ සැපයුම් උපගණයනට සීමා විය.

## කර්මාන්තකරණයේ, ව්‍යුහය සහ රටාව

ආහාර, පාන වර්ග සහ දුම්කොළ වර්ගයේ මුළු කාර්මික නිෂ්පාදනය 1965 පැවැති සියයට 49 සිට, 1969 දී සියයට 40 දක්වා සාපේක්ෂිත වශයෙන් පහත වැටුණ අතර, සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර හා උපකරණ නිෂ්පාදනයේ වටිනාකම, එම කාලසීමාව තුළදීම සියයට 7 සිට සියයට14 දක්වා දෙගුණ වීම 2 (ආ) 2 සංඛ්‍යා සටහනෙන් දක්වෙන පරිදි සැලකිය යුතු ලක්ෂණයකි. මෙකී උපනතිය රසායනික පෙට්‍රෝලියම්, ගල්අඟුරු, රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදනයන්හිද දක්නට විය.

සකස් කළ ලෝහ නිෂ්පාදන සහ යන්ත්‍ර උපකරණ ගණයේ ඒ ඒ නිෂ්පාදිතයන් සම්බන්ධයෙන් දක්නට ලැබුණ වැදගත් ලක්ෂණය වූයේ, මහණ මැෂින්, බයිසිකල් සහ නොයෙක් වර්ගවල විදුලි උපකරණ නිමැයුම වැඩිවීමය. කලකදී, නාගරික ගෘහ වල සුඛෝපභෝගී භාණ්ඩ ලෙස සැලකුන මෙකී ශීර්ෂයන් දැන් ගම්බද ගෘහවලද අත්‍යවශ්‍ය දෑ ලෙසින් සැලකෙන අතර මේවා සඳහා අලෙවියද සැලකිය යුතු තරමින් පුළුල් විය. කෘෂිකාර්මික සංවර්ධනය සහ කෘෂිකාර්මික අංශයේ ආදායම වැඩිවීම මෙයට තරමක් දුරට හේතු වූ බැව් දක්විය හැකිය.

සකස් කළ ලෝහ භාණ්ඩ, ගණයට ඇතුලත් කළ නිෂ්පාදිතයක් වන මෙරට නිෂ්පාදිත බ්ලේඩ් තල සඳහා පාරිභෝගිකයා දක්වන අරුචිය, මෙම භාණ්ඩය නිපද වන ඒ ඒ ව්‍යාපාරික ආයතනයන්හි නිෂ්පාදනයේ කැපී පෙණෙන අයුරින් පහත වැටීම තුලින් මැනවින් පැහැදිලිව පෙනේ. මෑතක සිට, මෙම දේශීය නිෂ්පාදිතය සඳහා වූ ඉල්ලුම පහත වැටෙන්නට විය. එයට විශේෂයෙන්ම හේතු වූයේ උසස් නිමාවකින් යුතු විදේශීය බ්ලේඩ් තල ආනයන තහනම පවතිද්දීත්, පහසුවෙන් ලබා ගත හැකි වීමය. මෙම භාණ්ඩය නිෂ්පාදනය කරන ව්‍යාපාරික ආයතන සියල්ලම සිය නිමැයුම තදින්ම කපා හැර තිබේ. එක් ව්‍යවසායයක් සිය නිෂ්පාදනය සියයට 70 කින් කපනු ලැබූ අතර, ඔහුගේ කර්මාන්ත ශාඛාවේ, සාමාන්‍ය නිෂ්පාදන පිරිහීම 1968 දී වාර්තා ගතවූ මුළු වටිනාකමින් සියයට 51 ක් විය.

II (ආ) 3 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති පරිදි ප්‍රධාන ආර්ථික වර්ග අනුව කාර්මික නිෂ්පාදනය වර්ග කිරීමේදී පාරිභෝජන භාණ්ඩ, අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ යන ප්‍රධාන වර්ගත්‍රයෙහි සාපේක්ෂක කොටස්හි 1969 වර්ෂය තුළදී එතරම් වෙනසක් නොවූ බව පෙනී යයි. එහෙත් 1965 සිට 1969 දක්වා වූ කාලය සඳහා වන සංඛ්‍යා තොරතුරු ගෙන බැලුවහොත් නිෂ්පාදනය, පාරිභෝජන සහ අන්තර් භාණ්ඩවල සිට ආයෝජන භාණ්ඩ අතට නැඹුරු වී ඇති බව පෙනේ. මෙම කාලය තුළදී පාරිභෝජන හා අන්තර් භාණ්ඩ නිෂ්පාදනයෙහි මුළු වටිනාකම පිළිවෙලින් සියයට 53·9 සිට සියයට 51·7 දක්වාද, සියයට 37·3 සිට සියයට 31·1 දක්වාද අඩු වූ අතර ආයෝජන භාණ්ඩ නිෂ්පාදනය සියයට 8·7 සිට සියයට 17·2 දක්වා වැඩි වී ඇත. පාරිභෝජන භාණ්ඩ ගණයෙහි ආහාර පාන හා දුම්කොළ, විවිධ රසායනික නිෂ්පාදිතයන් සහ නූල් කැටීම, රෙදි වියීම සහ නිමැවුම යන අංශයන්හි නිෂ්පාදන වටිනාකම සැලකිය යුතු ලෙස වැඩිවූ අතර අන්තර් භාණ්ඩ ගණයෙහි ප්‍රධාන වශයෙන්ම එළවළු තෙල් වලින් සහ කපාපු පොල් වලින් සමන්විත වන විවිධ ආහාර සැකැසීමේ උපගණය රුපියල් දශලක්ෂ 371·2 සිට රුපියල් දශලක්ෂ 354·2 දක්වා පහළ වැටුණි. එහෙත් විදුලි යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ මෙවලම් උපගණයේ නිෂ්පාදන වටිනාකම රුපියල් දශලක්ෂ 41·8 සිට රුපියල් දශලක්ෂ 66·3 දක්වා ඉහළ නැංගේය. ආයෝජන භාණ්ඩ වර්ගයෙහි රුපියල් දශලක්ෂ 55 ක්වූ වැඩිවීමෙන් සියයට 93 කට පමණ වගකිව යුතු වූයේ සිමෙන්ති, හා සිමෙන්ති නිශ්පාදිතයන් සහ ඇස්බෙස්ටෝස් නිශ්පාදිතයන් හා යන්ත්‍රසූත්‍ර (විදුලි යන්ත්‍රසූත්‍ර හැර) සහ ප්‍රවාහණ උපකරණ උපගණයන්ය.

**කාර්මික ඒකකයන්හි විශාලත්වය:**

නිෂ්පාදන වටිනාකම් හා වැටුප් බිල අනුව කාර්මික ඒකකයන්හි විශාලත්වයේ ව්‍යාප්තිය පිළිවෙලින් II (ආ) 4 සහ II (ආ) 5 වෙනි සංඛ්‍යා සටහන්වල දක්වා ඇත. සුළු-පරිමාණ කර්මාන්තයෙහි තවමත් වැඩි බරක් දක්නට තිබෙන්නේ පාරිභෝජන භාණ්ඩ ගණයෙහිය. එම ගණයෙහි ප්‍රධාන නිශ්පාදිතයන් වනුයේ සකස් කළ ආහාර ද්‍රව්‍ය, මසන ලද ඇඳුම්, සහ අත් යන්ත්‍ර රෙදිපිළිය. II (ආ) 4 වන සංඛ්‍යා සටහනෙහි දක්වෙන අන්දමට, නිමැවුම් වටිනාකම රුපියල් 250,000 ට අඩු ගණය තුළ නිමැවුමෙහි මුළු වටිනාකමින් සියයට 5·9 කට පමණක් ඒකක 1,105 ක් ගණනය වෙයි. මේ අතර නිමැවුම් වටිනාකම රුපියල් දශලක්ෂ 2 ට සහ ඊට වැඩි ගණය තුළ මුළු නිමැවුමින්

## II (ආ) 3 වැනි සංඛ්‍යා සටහන

## 1965 – 69 කර්මාන්ත නිෂ්පාදනයේ වටිනාකම ප්‍රධාන ආර්ථික ගණ අනුව.

| | රුපියල් දශ ලක්ෂ | | | | | සියයට ගණන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1965 | 1966 | 1967 | 1968 | 1969 | 1965 | 1966 | 1967 | 1968 | 1969 |
| **අ. පාරිභෝගික භාණ්ඩ** .. | **456·9** | **480·3** | **528·9** | **694·8** | **841·4** | **53·9** | **56·5** | **55·4** | **49·7** | **51·7** |
| I. ආහාරපාන හා දුම්කොළ .. | 143·9 | 144·0 | 185·7 | 238·4 | 287·6 | 17·0 | 16·9 | 19·5 | 17·0 | 17·7 |
| අ. සැකසූ ආහාර .. | 28·0 | 30·9 | 33·7 | 40·8 | 45·8 | 3·4 | 3·6 | 3·5 | 2·9 | 2·8 |
| ආ. කල්තැබිය හැකි සහ ටින්වල අසුරන ලද පලතුරු, එළවළු, මස් මාළු සහ අනෙකුත් මුහුදු ආහාර(2) .. | 5·4 | 5·1 | 6·7 | 8·4 | 8·6 | 0·6 | 0·6 | 0·7 | 0·6 | 0·1 |
| ඇ. විස්කෝතු සහ රසකැවිලි .. | 34·9 | 38·6 | 33·3 | 44·3 | 49·9 | 4·1 | 4·5 | 3·5 | 3·2 | 3·5 |
| ඈ. සිසිල් බීම .. | 16·0 | 11·6 | 14·5 | 17·3 | 17·9 | 1·9 | 1·4 | 1·5 | 1·2 | 1·1 |
| ඉ. අරක්කු, බීර, ස්ටවුට යනාදිය (3) .. | 7·6 | 5·5 | 5·5 | 17·1 | 59·5 | 0·9 | 0·6 | 0·6 | 1·2 | 3·1 |
| ඊ. දුම්කොළ .. | 52·0 | 52·3 | 92·0 | 110·5 | 105·9 | 6·1 | 6·2 | 9·7 | 7·9 | 6·7 |
| II. ඇඳුම් පැළඳුම්(4) .. | 55·5 | 56·1 | 48·1 | 55·7 | 56·0 | 6·5 | 6·6 | 5·0 | 4·0 | 3·5 |
| III. පාවහන් සහ සම් භාණ්ඩ .. | 24·7 | 27·7 | 31·9 | 32·4 | 38·9 | 2·9 | 3·3 | 3·3 | 2·3 | 2·4 |
| IV. විවිධ රසායනික භාණ්ඩ (5) .. | 91·2 | 101·9 | 98·2 | 118·9 | 155·6 | 10·8 | 12·0 | 10·3 | 8·5 | 9·4 |
| V. කඩදාසි නිෂ්පාදිතයන් සහ කඩදාසි භාණ්ඩ (6) .. | 16·2 | 22·3 | 20·8 | 19·4 | 13·4 | 1·9 | 2·6 | 2·2 | 1·4 | 0·8 |
| VI. සෑදූ ලෝහ භාණ්ඩ යන්ත්‍රෝපකරණ හැර (7) .. | 9·0 | 7·7 | 7·7 | 9·1 | 13·1 | 1·0 | 0·9 | 0·8 | 0·7 | 0·8 |
| VII. ප්ලාස්ටික් භාණ්ඩ .. | 13·4 | 14·5 | 15·9 | 32·5 | 28·2 | 1·6 | 1·7 | 1·8 | 2·3 | 1·7 |
| VIII. විදුරු සහ විදුරු භාණ්ඩ . | — | — | — | 4·8 | 7·7 | — | — | — | 0·3 | 0·5 |
| IX. පිඟන් බඩු .. | 2·4 | 2·3 | 4·4 | 8·5 | 8·7 | 0·3 | 0·3 | 0·5 | 0·6 | 0·5 |
| X. රබර් භාණ්ඩ (8) .. | 8·0 | 7·0 | 14·0 | 28·2 | 41·3 | 1·0 | 0·8 | 1·4 | 2·0 | 2·5 |
| XI. නූල් කැටීම, රෙදිපිළි වියීම හා නිම කිරීම .. | 91·3 | 95·1 | 97·1 | 136·2 | 172·2 | 10·8 | 11·2 | 10·2 | 9·7 | 10·6 |
| XII. දැව නිෂ්පාදන .. | — | — | 3·6 | 8·0 | 9·2 | — | — | 0·4 | 0·6 | 0·6 |
| XIII. නිෂ්පාදන භාණ්ඩ අන් තැනක සඳහන් නොවූ(9) .. | 1·3 | 1·7 | 1·5 | 2·7 | 9·5 | 0·1 | 0·2 | 0·1 | 0·2 | 0·6 |
| **ආ. අන්තර් භාණ්ඩ** | **316·1** | **296·5** | **297·2** | **478·8** | **505·2** | **37·3** | **34·9** | **31·2** | **34·2** | **31·1** |
| I. ආහාර නිෂ්පාදිතයන් (10) .. | 271·6 | 245·9 | 236·6 | 371·2 | 354·2 | 32·1 | 28·9 | 24·8 | 26·5 | 21·8 |
| II. සෑදූ ලෝහ භාණ්ඩ (යන්ත්‍රෝපකරණ හැර) (11) .. | 9·3 | 8·5 | 8·5 | 8·9 | 10·7 | 1·1 | 1·0 | 0·9 | 0·6 | 0·7 |
| III. කඩදාසි නිෂ්පාදිතයන් සහ කඩදාසි භාණ්ඩ (12) .. | 13·1 | 11·5 | 13·9 | 35·2 | 48·9 | 1·5 | 1·4 | 1·5 | 2·5 | 3·0 |
| IV. තුනී ලෑලි .. | 5·2 | 6·5 | 6·8 | 8·9 | 8·8 | 0·6 | 0·8 | 0·7 | 0·6 | 0·5 |
| V. ඉල්මනයිට් නිෂ්පාදිතයන් .. | 1·3 | 1·4 | 1·4 | 2·2 | 3·1 | 0·2 | 0·2 | 0·1 | 0·2 | 0·2 |
| VI. කාර්මික රසායන (23) .. | 1·6 | 1·9 | 1·9 | 2·3 | 2·2 | 0·2 | 0·2 | 0·2 | 0·2 | 0·1 |
| VII. විදුලි යන්ත්‍ර සූත්‍ර, මෙවලම්, උපකරණ සහ සැපයුම් .. | 14·0 | 20·8 | 28·1 | 41·8 | 66·3 | 1·6 | 2·4 | 3·0 | 3·0 | 4·1 |
| VIII. පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු නිෂ්පාදිතයන් .. | — | — | — | 8·3 | 11·0 | — | — | — | 0·6 | 0·7 |
| **ඇ. ආයෝජන භාණ්ඩ** | **74·0** | **73·5** | **128·1** | **225·0** | **280·2** | **8·7** | **8·6** | **13·4** | **16·1** | **17·2** |
| I. සෑදූ ලෝහ භාණ්ඩ (යන්ත්‍රෝපකරණ හැර) (14) .. | 26·4 | 32·8 | 37·9 | 61·5 | 58·2 | 3·1 | 3·8 | 4·0 | 4·4 | 3·5 |
| II. රබර් භාණ්ඩ (15) .. | 11·1 | 11·9 | 6·7 | 13·0 | 11·5 | 1·3 | 1·4 | 0·7 | 0·9 | 0·7 |
| III. සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිතයන් සහ ඇස්බැස්ටෝස් නිෂ්පාදිතයන් .. | 36·5 | 28·8 | 53·5 | 70·0 | 89·0 | 4·3 | 3·4 | 5·6 | 5·0 | 5·5 |
| IV. යන්ත්‍ර සූත්‍ර (විදුලි යන්ත්‍ර හැර) සහ ප්‍රවාහණ උපකරණ .. | — | — | 19·8 | 45·9 | 77·9 | — | — | 2·0 | 3·3 | 4·8 |
| V. ගඩොල් සහ උළු .. | — | — | 10·2* | 7·3 | 14·8 | — | — | 1·1 | 0·5 | 0·9 |
| VI. යකඩ සහ වානේ (මූලික කර්මාන්ත 16) .. | — | — | — | 27·3 | 28·8 | — | — | — | 2·0 | 1·8 |
| එකතුව | 847·0 | 850·3 | 954·2 | 1,398·6 | 1,626·8 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

* විදුරු නිෂ්පාදිත අඩංගු වේ.

1· කිරි නිෂ්පාදනය, අයිස් ක්‍රීම් සහ ලුණු, යනාදිය.

2· ජෑම් වර්ග, ජෙලි වර්ග, සෝස් වර්ග, පලතුරු කෝඩියල් යනාදිය

3· අරක්කු නිෂ්පාදන සංඛ්‍යා 1968 සහ 1969 වර්ෂ

4· කමිස බැනියම් යනාදිය.

5· ඖෂධීය ද්‍රව්‍ය, අංගරාග සබන් වර්ග සහ පවිත්‍ර කිරීමේ සංයෝග, ගිනි පෙට්ටි, දන්තාලේප යනාදිය.

6· ලියන කඩදාසි අභ්‍යාස පොත් යනාදිය.

7· ඇලුමිනියම් භාණ්ඩ

8· මෝටර් රථ සහ බයිසිකල් ටයර් සහ ටියුබ්, සෙල්ලම් බඩු හා ගෘහෝපකරණ

9· බුරුසු, ගල්ලෑලි, මුද්‍රණ බ්ලොක්, සෙල්ලම් බඩු, සංගීත භාණ්ඩ යනාදිය.

10· ගව සහ කුකුල් ආහාර, එළවළු තෙල් වර්ග, අයිස්, කපාපු පොල් යනාදිය.

11· භාජන.

12· මුද්‍රණ කඩදාසි, කාටන්, අනිකුත් ඇසුරුම් පෙට්ටි සහ ඔතන කඩදාසි.

13· කෝස්ටික් සෝඩා සහ ක්ලෝරීන්

14· කටුකම්බි, කම්බි ඇණ, ගැල්වනයිස් කළ භාණ්ඩ යනාදිය.

15· ටයර් නැවත පිරවීම.

16· රෝල් සහ කම්බි භාණ්ඩ

සියයට 78·1 ක් වෙනුවෙන් ව්‍යාපාර සමාගම් 126 ක් ගණනය වෙයි. 1968 සහ 1969 වර්ෂයන් සඳහා අදාළ වන දත්තයන් පිළිබඳ සංසන්දනයක, කර්මාන්ත ව්‍යුහයෙහි ඇතිවූ වෙනස්කම් දක්නට ලැබේ. 1968 දී නිමැවුම රුපියල් 250,000 ට අඩු ගණයෙහි නිමැවුමේ ප්‍රතිශත වටිනාකම 28·1 ක්වූ අතර, රුපියල් දශලක්ෂ 2 ක් සහ ඊට වැඩිවූ ගණයෙහි එම වටිනාකම 54·7 ක් විය. එසේ වුවද, 1969 දී අනුරූප සංඛ්‍යාවන් පිළිවෙලින් සියයට 5·9 සහ සියයට ·78·1 ක් විය. මෙයින් පැහැදිලිවම පෙන්වනු ලබන්නේ, නිෂ්පාදනය පුළුල් ඒකකයන් කීපයක් තුළ සංකේන්ද්‍රණය වූ බවයි. රුපියල් 250,000 සිට රුපියල් දශලක්ෂ 2 ට අඩු ගණයේ නිමැවුම් වටිනාකම තුළ කිසිම වෙනසක් සිදුවී නොමැති අතර, 1968 දී සහ 1969 දී තිබූ සාපේක්ෂිත කොටස් පිළිවෙලින් සියයට 17·2 ක් සහ සියයට 16·0 ක් විය.

### II (අ) 4 වැනි සංඛ්‍යා සටහන

### 1969 නිෂ්පාදන සමාගම් විශාලත්වය අනුව බෙදී ගිය අයුරු නිමවුම් වටිනාකම පදනම් කොට

| කාර්මික ගණය | | නිමැවුම වටිනාකම | | | |
|---|---|---|---|---|---|
| | | රුපියල් 250 දහසට අඩු | රු. 250 දහසේ සිට රු. දශ ලක්ෂ | රු. දශලක්ෂ 2 හා ඊට වැඩි | එකතුව |
| I· ආහාර පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය | සමාගම් ගණන | 141 | 41 | 24 | 206 |
| | නිමැවුමේ % ගණන | 3·6 | 9·1 | 87·3 | 100·0 |
| II· රෙදි පිළි, ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්ත | සමාගම් ගණන | 466 | 72 | 22 | 560 |
| | නිමැවුමේ % ගණන | 10·2 | 16·3 | 73·5 | 100·0 |
| III· දැව සහ දැව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) | සමාගම් ගණන | 7 | 6 | 2 | 15 |
| | නිමැවුමේ % ගණන | 2·6 | 30·8 | 66·6 | 100·0 |
| IV· කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදන | සමාගම් ගණන | 59 | 31 | 5 | 95 |
| | නිමැවුමේ % ගණන | 7·9 | 37·9 | 54·2 | 100·0 |
| V· රසායන ද්‍රව්‍ය, ඛණිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | සමාගම් ගණන | 198 | 52 | 26 | 276 |
| | නිමැවුමේ % ගණන | 5·7 | 13·5 | 80·8 | 100·0 |
| VI· ලෝහ නොවන ඛණිජ නිෂ්පාදිතයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) | සමාගම් ගණන | 50 | 15 | 10 | 75 |
| | නිමැවුමේ % ගණන | 3·5 | 7·1 | 89·4 | 100·0 |
| VII· මූලික ලෝහ නිෂ්පාදිතයන් | සමාගම් ගණන | — | — | 1 | 1 |
| | නිමැවුමේ % ගණන | — | — | 100·0 | 100·0 |
| VIII· සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ නිෂ්පාදිතයන් | සමාගම් ගණන | 167 | 80 | 35 | 282 |
| | නිමැවුමේ % ගණන | 5·6 | 24·6 | 69·8 | 100·0 |
| IX· නිෂ්පාදිත භාණ්ඩ (අන් තැනක සඳහන් නොවන) | සමාගම් ගණන | 17 | 9 | 1 | 27 |
| | නිමැවුමේ % ගණන | 8·6 | 70·2 | 21·2 | 100·0 |
| එකතුව | සමාගම් ගණන | 1,105 | 306 | 126 | 1,537 |
| | නිමැවුමේ % ගණන | 5·9 | 16·0 | 78·1 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

II (අ) 5 වන සංඛ්‍යා සටහනෙහි වූ වැටුප් බිල මත පදනම්ව ඇති ව්‍යාපාරයන්හි විශාලත්වයේ ව්‍යාප්තියට අදාළ දත්තයන්ගෙන් පෙන්වනු ලබන්නේ රුපියල් 15,000 ට වඩා අඩු වැටුප් බිලක් ඇති තැනෙක සුළු – පරිමාණ ව්‍යාපාරයන් බහුල වශයෙන් පවත්නා බවයි. මෙම ගණය තුළ, ඒකකයන් 553 ක් පමණ වැටුප් බිලෙන්

## II (ආ) 5 වැනි සංඛ්‍යා සටහන

### 1969 නිෂ්පාදන සමාගම්, විශාලත්වය අනුව බෙදී ගිය අයුරු-වැටුප් පිරිවැය පදනම් කොට

| කාර්මික ගණය | | රුපි. 15 දහසට අඩු | රුපි. 15 දහස — 50 හසට අඩු | රුපි. 50 දහස— 500 දහසට අඩු | රුපි. 500 දහස සහ වැඩි | එකතුව |
|---|---|---|---|---|---|---|
| I. ආහාර පාන සහ දුම්කොළ නිෂ්පාදනය | සමාගම් ගණන | 101 | 53 | 34 | 7 | 195 |
| | වැටුප් වැයේ % ගණන | 3·2 | 6·8 | 23·8 | 66·2 | 100·0 |
| II. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් භාණ්ඩ කර්මාන්ත | සමාගම් ගණන | 200 | 134 | 61 | 13 | 408 |
| | වැටුප් වැයේ % ගණන | 5·0 | 11·9 | 26·9 | 56·2 | 100·0 |
| III. දව සහ දව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) | සමාගම් ගණන | 3 | 5 | 3 | 4 | 15 |
| | වැටුප් වැයේ % ගණන | 0·3 | 2·8 | 3·3 | 93·6 | 100·0 |
| IV. කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදනය | සමාගම් ගණන | 29 | 37 | 21 | 2 | 89 |
| | වැටුප් වැයේ % ගණන | 2·1 | 9·4 | 39·6 | 48·9 | 100·0 |
| V. රසායන ද්‍රව්‍ය, ඛණිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය | සමාගම් ගණන | 134 | 72 | 53 | 14 | 273 |
| | වැටුප් වැයේ % ගණන | 2·5 | 5·8 | 23·4 | 68·3 | 100·0 |
| VI. ලෝහ නොවන ඛණිජ නිෂ්පාදිතයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) | සමාගම් ගණන | 16 | 23 | 30 | 6 | 75 |
| | වැටුප් වැයේ % ගණන | 0·7 | 3·9 | 21·9 | 73·5 | 100·0 |
| VII. මූලික ලෝහ නිෂ්පාදිතයන් | සමාගම් ගණන | – | – | – | 1 | 1 |
| | වැටුප් වැයේ % ගණන | – | – | – | 100·0 | 100·0 |
| VIII. සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සහ උපකරණ නිෂ්පාදනය | සමාගම් ගණන | 59 | 82 | 113 | 10 | 264 |
| | වැටුප් වැයේ % ගණන | 1·4 | 7·0 | 48·8 | 42·8 | 100·0 |
| IX. නිෂ්පාදිත භාණ්ඩ (අන්තැනක නොසඳහන්) | සමාගම් ගණන | 11 | 6 | 10 | – | 27 |
| | වැටුප් වැයේ % ගණන | 7·8 | 13·4 | 78·8 | – | 100·0 |
| එකතුව | සමාගම් ගණන | 553 | 412 | 325 | 57 | 1347 |
| | වැටුප් වැයේ % ගණන | 2·5 | 7·1 | 29·2 | 61·2 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සියයට 2·5 කට පමණක් හිමිකම් කියන අතර, මහා පරිමාණ කර්මාන්තයෙහි ඒකක යන් 57 ක් සියයට 61·2 ක් වෙනුවෙන් හිමිකම් පා ඇත. 1968 දී අනුරූපි ප්‍රතිශත යන් පිළිවෙලින් සියයට 3·1 ක් සහ සියයට 62·7 ක් වෙයි. නිෂ්පාදනය, සේවා නියුක්තිය සහ තෝරා ගන්නා ලද ව්‍යාපාරයන් 175 ක වැටුප් පිළිබඳ දත්තයන් දක්වන II (ආ) 4 (I) වන සංඛ්‍යා සටහනින් තව දුරටත් දක්වන්නේ දේශීය කර්මාන්ත අංශයේ පවත්නා උපනතියයි. එම අංශය තුළ පුළුල් ව්‍යවසායයන්ගේ ඒකාබද්ධවීමේ ක්‍රියාවලිය සීඝ්‍රයෙන් වැඩිවන බව දක්නට ලැබේ. වාර්තා වෙමින් පවත්නා මුළු සංඛ්‍යා වෙන් සියයට 8·9 ක් නියෝජනය කරනු ලබන ඒකක 175 ක ගණයක් විසින් මුළු වැටුප් බිලෙන් සියයට 64·7 ක් සඳහාද මුළු කාර්මික නිෂ්පාදන වටිනාකමින් 63·2 සඳහාද හිමිකම් කියනු ලැබේ.

## II (ආ) 4 (1) වැනි සංඛ්‍යා සටහන

### තෝරා ගත් ව්‍යාපාරික[1] ආයතනවල සේවා නියුක්තිය, වැටුප් වැය සහ නිෂ්පාදන වටිනාකම

| කර්මාන්ත | සමාගම් ගණන (1) | සේවා නියුක්තිය (2) | වැටුප් වැය රු. දහස් (3) | නිෂ්පාදිතයේ වටිනාකම රු. දහස් (4) | නිෂ්පාදිතයේ මුළු වටිනාකමෙන් (4) සියයට ගණන වශයෙන් |
|---|---|---|---|---|---|
| 1· සැකසූ ආහාර .. | 13 | 3,944 | 8,483 | 136,184 | 59·1 |
| 2· කල්තබාගත හැකි සහ ටින්වල ඇසුරූ ආහාර | 2 | 170 | 164 | 3,237 | 37·5 |
| 3· බිස්කෝතු සහ රසකැවිලි .. | 8 | 1,622 | 2,744 | 40,531 | 81·2 |
| 4· පාන වර්ග .. | 5 | 2,089 | 7,357 | 27,295 | 89·5 |
| 5· දුම්කොළ .. | 5 | 4,104 | 19,681 | 88,825 | 83·9 |
| 6· ඇඳුම් සහ පැළඳුම් .. | 9 | 2,585 | 3,462 | 23,625 | 42·2 |
| 7· නූල් කැටීම සහ රෙදිපිළි වියීම .. | 19 | 10,509 | 11,124 | 139,806 | 81·2 |
| 8· සපත්තු සහ හම් .. | 4 | 1,979 | 6,116 | 30,975 | 79·7 |
| 9· දැව .. | 3 | 1,927 | 4,513 | 6,421 | 70·1 |
| 10· කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත .. | 12 | 2,567 | 7,345 | 45,298 | 72·7 |
| 11· විවිධ රසායනික ද්‍රව්‍ය .. | 20 | 3,552 | 15,836 | 139,398 | 89·6 |
| 12· ඛනිජ තෙල් සහ ගල් අඟුරු නිෂ්පාදිත .. | 2 | 341 | 1,237 | 10,215 | 92·7 |
| 13· රබර් නිෂ්පාදිත .. | 4 | 2,118 | 7,229 | 45,018 | 85·3 |
| 14· ප්ලාස්ටික් නිෂ්පාදිත .. | 8 | 897 | 1,562 | 17,324 | 61·4 |
| 15· වීදුරු සහ වීදුරු නිෂ්පාදිත .. | 2 | 565 | 881 | 5,400 | 69·8 |
| 16· සිමෙන්ති සහ ඇස්බැස්ටෝස් .. | 4 | 2,170 | 7,673 | 86,332 | 97·0 |
| 17· ගඩොල් සහ උළු .. | 4 | 1,299 | 2,037 | 9,534 | 64·3 |
| 18· සෑදූ ලෝහ නිෂ්පාදිත .. | 19 | 3,392 | 7,393 | 51,244 | 62·5 |
| 19· යන්ත්‍ර සහ ප්‍රවාහණ උපකරණ .. | 15 | 3,380 | 9,919 | 63,316 | 81·2 |
| 20· විදුලි යන්ත්‍ර .. | 17 | 2,005 | 4,236 | 57,458 | 86·7 |
| එකතුව | 175 (8·9*) | 51,215 (49·4*) | 128,992 (64·7*) | 1,027,436 (63·2*) | |
| මුළු එකතුව | 1962 | 103,726 | 199·5 රු.ද.ල | 1,626.8රු.ද.ල | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

* මුළු එකතුවෙහි සියයට ගණන වශයෙන්.

1 නිෂ්පාදන වටිනාකමෙ වැඩිවීම රුපියල් දශ ලක්ෂයට අධික.

වැටුප් පමණක් නොව කර්මාන්ත ඒකකවල ඉතා සුළු සංඛ්‍යාවක නිෂ්පාදනයේ සංකේන්ද්‍රණයද, II (ආ) 4 (I) වන සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති කර්මාන්තයෙහි සියළුම ශාඛාවන්හි පාහේ දක්නට ලැබේ. රාජ්‍ය අංශය ක්‍රියාත්මක නොවන කර්මාන්තයෙහි ශාඛාවන් සැලකිල්ලට ගන්නා කල, බිස්කට් සහ රස කැවිලිවල ඒකකයන් 8 ක් නිමැවුමෙහි සියයට 81·2 කට හිමිකම් කියූ අතර, පාන වර්ග සහ දුම්කොළ කර්මාන්තයන්හි එක් එක් වශයෙන් ව්‍යාපාරික සමාගම් 5 ක් සතුව පිළිවෙලින් සියයට 89·5 ක සහ සියයට 83·9 ක නිමැවුම් තුබුණි. විවිධ වර්ගයේ රසායනික ද්‍රව්‍ය ශාඛාවෙහි නිමැවුමින් සියයට 89·6 ක් ඒකකයන් 20 ක් විසින් ගණනය කැරිණි.

## II (අං) 6 වැනි සංඛ්‍යා සටහන

## නිෂ්පාදනය සහ අමු ද්‍රව්‍ය — 1969

රුපියල් දහස් ගණනින්

| කාර්මික ගණය | ව්‍යාපාරික ආයතන | නිෂ්පාදනය | අමු ද්‍රව්‍ය | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | දේශීය | | විදේශීය | | එකතුව | |
| | | | වටිනාකම | සියයට ගණන | වටිනාකම | සියයට ගණන | වටිනාකම | සියයට ගණන |
| I. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය .. | 184 | 231·7 | 75,548 | 53·4 | 65,858 | 46·6 | 141,406 | 100·0 |
| II. රෙදිපිළි, ඇඳුම් පැලඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්තය .. | 511 | 186·0 | 22,050 | 28·1 | 56,300 | 71·9 | 78,350 | 100·0 |
| III. දැව සහ දැව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) .. | 15 | 18·0 | 6,324 | 87·2 | 931 | 12·8 | 7,255 | 100·0 |
| IV. කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදන .. .. | 72 | 56·6 | 11,058 | 31·7 | 23,773 | 68·3 | 34,831 | 100·0 |
| V. රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල්, පෙට්‍රෝලියම්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය .. | 263 | 244·9 | 20,481 | 25·9 | 58,528 | 74·1 | 79,009 | 100·0 |
| VI. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිතයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) .. | 66 | 118·8 | 15,711 | 37·2 | 26,549 | 62·8 | 42,260 | 100·0 |
| VII. මූලික ලෝහ නිෂ්පාදිතයන් .. .. | 1 | 28·8 | 982 | 5·7 | 16,251 | 94·3 | 17,233 | 100·0 |
| VIII. සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ නිෂ්පාදනය .. .. | 253 | 216·4 | 24,979 | 21·1 | 93,363 | 78·9 | 118,342 | 100·0 |
| IX. නිෂ්පාදිත භාණ්ඩ (අන් තැනක නොසඳහන්) .. | 20 | 7·8 | 384 | 12·4 | 2,713 | 87·6 | 3,097 | 100·0 |
| එකතුව .. .. | 1,385 | 1,109·0 | 177,517 | 34·0 | 344,266 | 66·0 | 521,783 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

**අමු ද්‍රව්‍ය උපයෝගී කර ගැනීම.**

අමු ද්‍රව්‍ය උපයෝගීකරණය පිළිබඳ දත්තයන්, ඉකුත් වර්ෂයේදී ව්‍යාපාරික සමාගම් 1298 ක් ඉදිරිපත් කල අතර, මේ වර්ෂයේදී ව්‍යාපාරික සමාගම් 1385 ක් විසින් සපයන ලදී. දේශීය සහ විදේශීය දෙගණයන්හිම අමු ද්‍රව්‍ය උපයෝගීකරණය පිළිබඳ සංඛ්‍යා ලේඛණ II (ආ) 6 වන සංඛ්‍යා සටහනෙහි ඉදිරිපත් කොට ඇත. මෙම සංඛ්‍යා තොරතුරු වලින් පොදු නිගමනයන් කීපයකට එළඹිය හැකිය. පළමුව, නිෂ්පාදන වටිනාකමින් සියයට 50 කින් පමණ අමු ද්‍රව්‍යවල වටිනාකම සමන්විත වෙයි. දෙවනුව, විදේශීය අමු ද්‍රව්‍ය වල කොටස දේශීය අමු ද්‍රව්‍යවල කොටසට වඩා දෙගුණයකින් පමණ සමන්විත වී ඇත. තෙවනුව, රසායනික ද්‍රව්‍යයන් (74·1), මූලික ලෝහ (94·3) සහ සකස් කල ලෝහ (78·9) වර්ගයන්හි විදේශීය අමුද්‍රව්‍ය ඉතා විශාල ප්‍රතිශතයක් උපයෝගී කරගෙන ඇත.

මීට ඉහත සඳහන් කොට ඇති පරිදි එම වර්ගයන් නිෂ්පාදනයෙහි සැලකිය යුතු තරමේ වර්ධනයන් පෙන්වා තිබේ. විදේශීය අමු ද්‍රව්‍යවල ප්‍රතිශත කොටස පිළිවෙලින් සියයට 12·8 ක් සහ සියයට 46·6 ක්වූ දුව සහ දුව නිෂ්පාදිතයන් සහ ආහාර, පාන වර්ගයන් සහ දුම්කොළ ගණයන් හැරුණු කල අනෙකුත් සියළුම ගණයන් සතුව මුළු අමු ද්‍රව්‍ය අවශ්‍යතාවයන් සියයට 62 ක් ඉක්මවූ විදේශීය අමු ද්‍රව්‍ය යෙදවුම් තිබිණ.

1968 සහ 1969 සඳහා වූ දත්තයන්හි සංසන්දනයකින් පෙන්වනුයේ දේශීය සහ විදේශීය අමු ද්‍රව්‍ය උපයෝගීකරණයේ සාපේක්ෂ කොටස්වල සැලකිය යුතු වෙනසක් සිදු නොවූ බවයි. 1969 දී දේශීය හා විදේශීය අමු ද්‍රව්‍ය කොටස් පිළිවෙලින් සියයට 34·0 ක් සහ සියයට 66·0 ක්වූ අතර, ඉකුත් වර්ෂයේ අනුරූපීය ප්‍රතිශතයන් සියයට 35·5 ක් සහ සියයට 64·5 ක් විය. කෙසේ වුවත්, රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් කර්මාන්තයන්හි දේශීය සහ විදේශීය අමු ද්‍රව්‍ය යෙදවුම් සංයුතියෙහි සැලකිය යුතු වෙනසක් සිදුවී ඇති බව පෙනෙයි. මෙම අංශයෙහි දේශීය සහ විදේශීය අමු ද්‍රව්‍ය කොටස්, ඉකුත් වර්ෂයේදී වූ සියයට 41·7 සහ සියයට 58·3 සමග සැසඳූ කල 1969 දී එය සියයට 28·1 සහ සියයට 71·9 විය. මෙපරිද්දෙන්ම, 1968 දීට වඩා 1969 දී රසායනික, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත වර්ගයන්හි විදේශීය අමු ද්‍රව්‍ය යෙදවුම්වල වැඩි ප්‍රතිශත උපයෝගීකරණයක් ඇතිවූ බව පෙනී ගොස් ඇත.

විදේශීය අමු ද්‍රව්‍ය ලබා ගැනීමේ හැකියාව මත ලංකාවේ කාර්මික සංවර්ධනය ඉතා පුළුල් වශයෙන් රඳා පවත්නා බවට ඇති නිගමනයට එළැඹීම නොවැලැක්විය හැකිය. කර්මාන්ත අංශයෙහි සීඝ්‍ර දියුණුවක් ඇති වීමට තුඩු දුන් ප්‍රධාන හේතුන්ගෙන් එකක් නම් කර්මාන්ත අමු ද්‍රව්‍යයන්හි නිදහස් ගලා යෑමට ඉඩ සලසමින් මෑතදී රජය මගින් පැනවූ විධිවිධානයන්ය. අනෙක් අතට, දේශීය නිෂ්පාදිත භාණ්ඩවල අධික මිල සඳහා වගකිවයුතු ප්‍රධාන සාධක වලින් එකක් නම්, විදේශීය අමු ද්‍රව්‍යයන් මත කර්මාන්තය බොහෝ දුරට රඳා පැවතීමයි.

**සේවා නියුක්තිය**

ඉකුත් වර්ෂයේදී 101,348 ක්වූ සේවක පිරිස සමග සංසන්දනය කර බැලූ කල මෙම සමීක්ෂණය මගින් ආවරණය කරන ලද කර්මාන්ත අංශයෙහි සේවක පිරිස මුළුමනින් 103,726 ක් වූහ. සේවකයන් 2378 දෙනෙකුගේ ශුද්ධ වැඩිවීමෙන් කොටසක් පමණක් බොහෝ කොටම කුඩා ඒකකයන් වූ ව්‍යාපාරික ආයතන සංඛ්‍යාවේ වැඩිවීමට හේතු වූ බව ගෙන හැර දැක්විය හැකි වන අතර, ඉතිරිය, කර්මාන්තයේ විවිධ වර්ගයන්හි සේවා නියෝජන හැකියාවන්හි ඇතිවූ උච්චාවචනයනට ගණනය කළ හැකිය. හැමවිටම සේවා නියුක්තියේ වැඩිවීමත් සමගම නිමැවුමේ අනුරූප වැඩිවීම ඇති නොවීමේ සාධකයෙන්, මෙම කරුණ මැනෙවින් විදහා පායි.

1968 දී වූ රුපියල් 18,300 ක් බැගින් වූ එක් සේවකයකුගේ නිමැවුම සමග සසඳා බලන කල 1969 දී එක් සේවකයකුගේ නිමැවුම රුපියල් 15,648 ක් විය. මුළු ශ්‍රම දින ගණන 1968 දී 27,462 සිට 1969 දී 28,367 දක්වා ඉහළ ගිය අතර, සේවකයෙකුට වැටෙන ශ්‍රමික දිනයන් 271 සිට 273 දක්වා ස්වල්ප වශයෙන් ඉහළ නැගිණි. ආහාර, පාන වර්ග සහ දුම්කොළ, රෙදි පිළි, ඇඳුම් පැළඳුම් සහ සම් කර්මාන්තයන්හි ශ්‍රම දිනයන්හි ඉහළ ම සංඛ්‍යාව දක්නට ලැබේ.

### වැටුප්

වාර්තා කරන ලද ව්‍යාපාරික සමාගම්වල මුළු වැටුප් බිල 1968 දී රුපියල් දශලක්ෂ 188·4 සිට 1969 දී රුපියල් දශලක්ෂ 199·5 දක්වා වැඩිවී ඇත. මුළු වැටුප් වලින් සියයට 25 ක් පමණ ආහාර, පාන වර්ග සහ දුම්කොළ වර්ගය සඳහා ගණනය කොට ඇති අතර රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම්, රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල්අඟුරු, රබර් සහ ප්ලාස්ටික් එකතුව ගත් කල එම වර්ගයන් යුගල මුළු වැටුප් බිලෙන් සියයට 63 කට හිමිකම් කියනු ලබයි. දෙවනුව සඳහන් කල වර්ගද්වයෙහි වැටුප් බිල බොහෝ දුරට සමාන වුවද, ඉන් එක් ගණයක අනුරූපීය ශ්‍රමික දින ගණන අනෙකෙහි මෙන් දෙගුණ විය. ශ්‍රමික දිනක වැටුප් රුපියල් 4·94 ක් සහ රුපියල් 9·86 ක්වූ මෙම කර්මාන්ත ගණ ද්වයෙහි ශ්‍රමික දිනක වැටුපෙහි සැලකිය යුතු වෙනසක් පිළිබිඹු වෙයි.

### බලය හා ඉන්ධන

බලය හා ඉන්ධන උපයෝගී කර ගැනීම පිළිබඳ සංඛ්‍යා තොරතුරු II (ආ) 7 සංඛ්‍යා සටහනෙහි දැක්වෙයි. බලය හා ඉන්ධන පිළිබඳව දත්තයන් ඉදිරිපත් කල ව්‍යාපාරික ආයතන සංඛ්‍යාව 555 ක්වූ අතර, ඉකුත් වසරේදී එම සංඛ්‍යාව 506 ක් විය. බලය හා ඉන්ධන පිරිවැයෙන් සියයට 50 ක් පමණ ගණනය වූයේ විදුලිය සඳහාය. පැට්‍රෝල් සහ තෙල්වල කොටස සියයට 40 ක් පමණ වූ අතර එයද සැලකිය යුතු ප්‍රමාණයක් වෙයි. නිෂ්පාදනය සඳහා යොදවා ගත් විදුලිය, පැට්‍රෝල් සහ තෙල්වල පිරිවැය පිළිවෙලින් රුපියල් දශලක්ෂ 607·4 ක් රුපියල් දශලක්ෂ 9·1 ක් සහ රුපියල් දශලක්ෂ 7·7 ක් යනුවෙන් අගය කොට තිබේ. රුපියල් වටිනාකම අනුව බලය සහ ඉන්ධන නිමැවුමෙහි පිරිවැය 1969 දී ශත ·031 ක් විය. 1968 දී එය ශත ·029 ක් විය.

**II (ආ) 7 වැනි සංඛ්‍යා සටහන**
**නිෂ්පාදනය සහ ඉන්ධන — 1969**

රුපියල් දහස් ගණනින්

| කාර්මික ගණය | සමාගම් ගණන | නිෂ්පාදනය | පාවිච්චි කළ ඉන්ධන | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | විදුලිය බලය | ගල් අඟුරු සහ ගෑස් | පැට්‍රල් සහ තෙල් | අනෙකුත් | එකතුව |
| I. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය .. | 93 | 102,138 | 1,608 | 194 | 509 | 59 | 2,370 |
| II. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්ත .. | 141 | 107,077 | 1,118 | 15 | 566 | 15 | 1,714 |
| III. දැව සහ දැව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) .. | 4 | 1,685 | 18 | – | – | – | 18 |
| IV. කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදනය .. | 35 | 46,191 | 660 | 16 | 899 | – | 1,575 |
| V. රසායන ද්‍රව්‍ය, පෙට්‍රෝලියම්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදන .. | 105 | 133,801 | 869 | 24 | 254 | 479 | 1,626 |
| VI. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිතයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) .. | 21 | 91,845 | 3,741 | – | 5,177 | 476 | 9,334 |
| VII. මූලික ලෝහ නිෂ්පාදිතයන් .. | ලැ;නො: | ලැ:නො: | ලැ:නො: | ලැ:නො: | ලැ:නො: | ලැ:නො: | ලැ.නො: |
| VIII. සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ නිෂ්පාදනය .. | 139 | 121,311 | 1,069 | 393 | 309 | 139 | 1,910 |
| IX. නිෂ්පාදිත භාණ්ඩ (අන් තැනක සඳහන් නොවන) | 17 | 3,390 | 35 | 2 | 3 | 1 | 41 |
| එකතුව .. | 555 | 607,438 | 9,118 | 644 | 7,657 | 1,169 | 18,588 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව